ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය - 2010

----------------------------------------------------------

1 **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මතය</u>**

මෙම වාර්තාවේ ඇතුලත් අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නො හැකි ය.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව වත්කම් භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත්, ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුල අත්පත් කර ගෙන තිබුණු රු. 16,408,695 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂය කර නො තිබුණි. එමෙන්ම, කෙරිගෙන යන වැඩ ගිණුමේ දැක්වෙන මීගමුව නේවාසිකාගාර ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.429,612 ක ක්ෂය ප්‍රතිපාදන ඇති කර තිබුණි.

(ආ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ආයතනය වෙත ලබා දී තිබුණු රු. 37,960,838 ක් වූ ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 පරිදි ගිණුම් ගත කිරීමටත් , අවශ්‍ය හෙළිදරව් කිරීමටත් කටයුතු කර නො තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ලෙජර් ගිණුම් 17 ක රු. 60,629,405 ක ගණනය කිරීමේ දෝෂ පැවැතිණි.

(ආ) ගිණුම් විෂයයන් 03 කට අදාල රු. 95,182,149 ක් වූ පසු ගිය වර්ෂ අවසානයේ දී ඉදිරියට ගෙනයන ලද ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ලෙජරයේ සටහන් කර නො තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් අපහරණය කිරීමේ දී ඊට අදාල සමුච්චිත ක්ෂය හා වත්කම් විකිණීමෙන් ලද මුදල් එම වත්කමේ පිරිවැයට ගැලපීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය ගිණුම් මගින් පෙන්වීම වෙනුවට, වත්කම් විකිණීමෙන් ලද රු. 474,346 ක් වූ මුළු මුදලම සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස දක්වා තිබුණි.

(ඈ) වැඩමුළුවක් වෙනුවෙන් දරන ලද රු. 1,975,908 ක් වූ වියදම ආයෝජන ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවැතුණු රු. 126,531 ක හඳුනා නො ගත් බැර ශේෂයක් නිවැරදිව හඳුනාගෙන නිරවුල් කර ගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වූ රු. 728,561 ක අවිනිශ්චිත ශේෂයට එරෙහිව ලියා හැර තිබුණි.

(ඊ) අවසාන ගිණුම සමඟ ඉදිරිපත් කළ ශේෂ පිරික්සුමට අනුව අවිනිශ්චිත ගිණුම් ශේෂය ලෙස රු. 602,030 ක් දක්වා තිබුණ ද , 2010 දෙසැම්බර් 31 දිනට වූ මුදල් පොතේ ශේෂය ද ඇතුළුව ලෙජරයේ අවසාන හර හා බැර ශේෂයන් අතර වෙනස රු.83,651,159 ක් වී තිබුණි.

(උ) ජර්නල් සටහන් 09 ක් මගින් මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යාවන්හි සිදුකර තිබුණු වෙනස්කම්වල වටිනාකම රු. 21,273,214 ක් වූ නමුත් එම ජර්නල් සටහන් මගින් ලෙජරයේ ශේෂයන් සංශෝධනය කර නො තිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

වර්ෂ කිහිපයක සිට දිගින් දිගටම පවතින රු. 7,752,204 ක අක්‍රීය වත්කම් ශේෂ 07 ක් හා රු. 1,168,298 ක අක්‍රීය වගකීම් ශේෂ 04 ක් නිරවුල් කිරීම ට පියවර ගෙන නො තිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) එකතුව රු.127,808,267 ක් වූ පහත සඳහන් ගිණුම් විෂයයන් 09 ක් සම්බන්ධයෙන් එම එක් එක් විෂයයක් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය / සත්‍යාක්ෂණය හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 95,839,673 | ස්ථාවර වත්කම් ලේඛන |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ | 196,598 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ණයහිමියෝ | 1,511,281 | උප ලේඛන,ශේෂ තහවුරු කිරීම් හා කාල විශ්ලේෂණ |
| ණයගැතියෝ | 10,544,517 | |
| සේවක ණය | 4,581,909 | |
| බැංකු ශේෂය | 6,136,324 | සැසඳුම් වාර්තා හා ශේෂ තහවුරු කිරීම් |
| සේවක අර්ථසාධක ගෙවීම් | 4,886,577 | ගෙවීම් සම්බන්ධ ලිපිගොනු |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගෙවීම් | 1,224,038 | |
| අංක - 02 නේවාසිකාගාරය අළුත්වැඩියාව | 2,887,350 | ගිවිසම, තාක්ෂණ නිළධාරි සහතිකය |

(ආ) 2008 හා 2009 වර්ෂ වෙනුවෙන් නිකුත් කළ පිළිවෙලින් විගණන විමසුම් 11 ක් හා 07 ක් සඳහා 2011 මැයි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නො තිබුණි. ඒවායේ ගණනය කළ හැකි වටිනාකම රු. 15,675,055 ක් විය.

1.2.6 නීති, රීති, රෙගුලාස සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) මුදල් රෙගුලාසි** | |
| (i) මු.රෙ. 135 | මූල්‍ය පාලන බලතල කාලානුරූපව සමාලෝචනය කොට අවශ්‍ය ප්‍රතිශෝධන කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 371(2) (ආ) උප ජේදය | අවස්ථා 24 ක දී රු. 20,000 කට වැඩි එකතුව රු.1,636,771 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |
| (iii) මු. රෙ. 395(ඇ) උප ජේදය | සෑම මාසයක් සඳහා ම බැංකු සැසඳුම් පිළියෙල කළ යුතු වුවත්, ආයතනය සතු බැංකු ගිණුම් 02 ක් වෙනුවෙන් කිසිදු මාසයක් සඳහා බැංකු සැසඳුම් පිළියෙල කර නො තිබුණි. |
| **(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| 4.2 (ඇ) උප ජේදය | ප්‍රවර්තන වර්ෂය තුල දී මිළ දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අනුමත කර ගෙන නො තිබුණි. |

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | | |
|---|---|---|
| (i) | 5.2.6 උප ජේදය | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශයක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවැයගත ශේෂ පත්‍රයක් පිළියෙල කර අයවැය ලේඛණය සමඟ ඉදිරිපත් කර නො තිබුණි. |
| (ii) | 6.5.1 උප ජේදය | මුදල් වර්ෂය අවසාන වී දින 60 කට පෙර කෙටුම්පත් වාර්ෂික වාර්තා, රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , 2010 වර්ෂය වෙනුවෙන් ඒ අනුව කටයුතු කර නො තිබුණි. |
| (iii) | 7.4.1 උප ජේදය | අවම වශයෙන් ත්‍රෛමාසිකව විගණන හා කළමනාකරණ කමිටුව රැස්විය යුතු වුවත් , 2009 අප්‍රේල් 04 දින සිට 2011 මැයි 31 විගණිත දින දක්වාම එම කමිටු රැස්වීම් පවත්වා නො තිබුණි. |
| (iv) | 7.4.2 උප ජේදය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නො තිබුණි. |

(ඈ) 2006 නොවැම්බර් 25 දිනැති අංක 20/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

| | |
|---|---|
| 04 හා 06 උප ජේද | පොත් මිළ දී ගැනීම සඳහා වර්ෂය තුල දෙන ලද විශේෂ අත්තිකාරම් දෙන ලද වර්ෂය තුල දී ම අය කර ගත යුතු වුවද, රු. 92,700 ක් වූ 2010 වර්ෂයේ ආරම්භයේ පැවති ශේෂයෙන් වර්ෂය තුල අය කිරීම් රු. 2,000 ක් වූ අතර වර්ෂ අවසාන ශේෂය රු. 292,200 ක් විය. |

(ඉ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නො තිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

--------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,640,675 ක ඌනතාවක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාව රු.19,148,559 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,507,884 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණ. පාඨමාලා ගාස්තු රු.4,325,988 කින් වැඩි වී තිබීම මෙම වාසිදායක විචලනයට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

#### 2.2.1 කාර්ය සාධනය

-----------------

ලිඛිතව ඉල්ලීම් කළ ද , ආයතනයේ භෞතික කාර්ය සාධනය හා සම්බන්ධ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය. එහෙයින් සමාලෝචිත වර්ෂයේදී ඉලක්කගත හා තථ්‍ය කාර්ය සාධනය සැසඳිය නොහැකි විය.

2.2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

මට්ටක්කුලිය අංක - 02 නේවාසිකාගාර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම

-----------------------------------------------------------------------------------

(i) ඉහත කොන්ත්‍රාත්තුවට අදාල ලියකියවිලිවල මුල් පිටපත් අල්ලස් හෝ දූෂණ පිළිබඳ කොමිසමේ නිලධාරීන් විසින් රැගෙන ගොස් තිබුණු බව ගොනුව අනුව නිරීක්ෂණය වූ නමුත් එම ආයතනයට ලිපිගොනු බාර දුන් බවට විධිමත් සනාථ කිරීමක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ii) අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීමේ දී රු. 124,427 ක රඳවා ගැනීම් (Retention) අඩු කර ගෙන නො තිබුණි.

(iii) 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත මගින් සංශෝධිත එම පනතේ 26 (අ) වගන්තිය අනුව සැපයුම් මත කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු. 380,238 ක එකතු කළ අගය මත බද්දෙන් 33 1/3% ක් වූ රු.126,746 ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම සඳහා අදාල බිල්පත්වලින් අඩු කොට රඳවා ගැනීමට කටයුතු කර නො තිබුණි.

(iv) රු. 281,298 ක අතිරේක වැඩ සඳහා ප්‍රමාණ බිල්පත් ඉදිරිපත් කර නො තිබුණ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 උප ජේදය පරිදි වැඩ අවසන් කිරීම පිළිබඳ ව ආයතනයේ තාක්ෂණ නිලධාරි සහතික කර නො තිබුණි.

2.2.3 පාඩු හා හානි

----------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් රු. 72,222 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

(ආ) නාරා ආයතනයට අයත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන කාර්යාලයට අදාල විදුලි බිල් පත් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් දිගින් දිගට ම අධිභාර ගෙවා තිබුණු අතර නියැදි පරීක්ෂාවට භාජනය කළ 2009 හා 2010 වර්ෂ සඳහා පමණක් රු. 91,498 ක් අධිභාර ගෙවා තිබුණි.

### 2.2.4 වාහන උපයෝජනය

------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වර්ෂ කිහිපයක සිට පවතින නැවත අළුත්වැඩියා කළ නො හැකි, දිරාපත් ව තිබුණු වාහන 04 ක් හා සුනාමි ව්‍යවසනයෙන් විනාශ වී තිබුණු වර්ෂ 06 ක් පැරණි වාහන 03 ක් අපහරණය කිරීමට පියවර ගෙන නො තිබුණි.

(ආ) අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන 04 ක් වර්ෂ කිහිපයක සිට නිශ්කාර්ය ව තිබුණු අතර රජයේ කර්මාන්ත ශාලාවට අළුත්වැඩියාව සඳහා භාර දුන් වාහනයක අළුත්වැඩියා කටයුතු නිම කර තිබිය දී ත් ගෙවීම් නො කිරීම නිසා මාස 15 ක් රජයේ කර්මාන්ත ශාලාව තුල නිශ්කාර්යව පැවැතිණි.

(ඇ) ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් පරිත්‍යාග කළ වාහන 05 ක හා ධීවර අමාත්‍යාංශයෙන් ලද වාහනයක හිමිකාරත්වය ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නො තිබුණි.

### 2.2.5 අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තනතුරු 112 ක පුරප්පාඩු පැවැති අතර ඒ තුල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 02 ක් ද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ උසස් තනතුරු 27 ක් ද පැවැතිණි.

(ආ) කාර්යාල කාර්ය සහායක තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය 20 ක් වුවත් ,තථ්‍ය කාර්ය මණ්ඩලය 50 ක් විය.එම අතිරික්ත සේවකයින් 30 දෙනාගෙන් 27 දෙනෙකුම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර ඔවුන් වෙනුවෙන් වැටුප් ලෙස රු. 5,598,720 ක් 2010 වර්ෂය තුල ගෙවා තිබුණි. මෙම අතිරික්ත සේවකයන් බඳවා ගැනීම වෙනුවෙන් 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 ප්‍රකාර භාණ්ඩාගාර අනුමැතිය ලැබී නො තිබුණි.

### 2.2.6 සංයුක්ත සැලැස්ම

---------------------

2003 ජූනි 02 දිනැත අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 උප ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිපල පිළිබඳ සමාලෝචනයක් 2008-2011 කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැසුමෙහි අන්තර්ගත ව නො තිබුණි. එමෙන්ම, මුදුන් පමුණුවාගත යුතු ඉලක්කයන් හි

මූල්‍යමය අගයන් දක්වා නො තිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය මූල්‍යමය වශයෙන් ඇගැයීමට නො හැකි විය.

### 2.2.7 අයවැය ලේඛණමය පාලනය

----------------------------------

සමාලෝචිත වර්ෂයේ පහත සඳහන් පරිදි අයවැය ගත පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් රු.9,964,852 ක සැලකිය යුතු විචලනයන් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පුද්ගල පාරිශ්‍රමික | 56,385,000 | 62,099,555 | (5,714,555) |
| ගමන් වියදම් | 425,000 | 1,241,145 | (816,145) |
| සැපයුම් | 1,400,000 | 2,495,395 | (1,095,395) |
| නඩත්තු | 715,000 | 1,078,790 | (363,790) |
| කොන්ත්‍රාත්ගත සේවා | 5,025,000 | 8,112,345 | (3,087,345) |
| පුහුණු කටයුතු | 6,860,000 | 5,197,850 | 1,662,150 |
| අනෙකුත් | 1,815,000 | 2,364,772 | (549,772) |
| | | | 9,964,852 |

## 3. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී . පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) වත්කම් පාලනය

(ඉ) සැලැසුම් සකස් කිරීම

(ඊ) සැපයුම් හා සේවා මිලදී ගැනීම